# <u>මොරටුව විශ්වවිද්‍යාලයේ පුරප්පාඩු</u>

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ විශ්වවිද්‍යාලවල හා ඊට අනුබද්ධ උසස් අධ්‍යාපන ආයතනවල **තනතුරෙහි ස්ථිර කරන ලද සේවකයින්ගෙන් පමණක්** අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කළ අයදුම්පත් තමා සේවය කරන ආයතනයේ ලේකම්/ලේඛකාධිකාරී/මණ්ඩපාධිපති/අධ්‍යක්ෂ මගින් **2017.08.04 වෙනි දින හෝ ඊට පෙර ලැබෙනසේ ලේඛනගත තැපෑලෙන් මොරටුව විශ්වවිද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරී/ ආයතන (අනධ්‍යයන) වෙත ලැබීමට සැලැස්විය යුතුය.**

අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලිවීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුවේ. කිසියම් අයදුම්පතක් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා හෝ යළි එය සලකා බලනු නොලැබේ.

කොමිෂන් සභා චක්‍රලේඛ අංක 692 විධිවිධාන අනුව වෘත්තීය/යෝග්‍යතා/ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතාවය පදනම් කරගෙන සුදුස්සන් බඳවාගනු ලැබේ. තවද පහත සඳහන් තනතුරු සඳහා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2017 වර්ෂයේ වැටුප් ක්‍රමය අදාල වේ.

## 01 <u>නියෝජ්‍ය ප්‍රධාන ආරක්ෂක නිලධාරී</u>

අවශ්‍ය සුදුසුකම් (I) I ශ්‍රේණියේ ආරක්ෂක පරීක්ෂක හෝ ඉන් ඉහළ තනතුරක සේවයේ නියුතුව, ආරක්ෂක පරීක්ෂකවරයකු වශයෙන් වසර 16 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

වැටුප් ක්‍රමය : රු.30,380-20x438;1x525-39,665/-(මාසික) U-MN 4(II)

## 02 <u>වැඩ අධිකාරී(කර්මාන්තශාලා) II ශ්‍රේණිය</u>

අවශ්‍ය සුදුසුකම් (I) තාක්ෂණ විද්‍යා ජාතික ඩිප්ලෝමා සහතික පත්‍රය හෝ ඊට සමාන සුදුසුකම් සහ එම සුදුසුකම් ලබා ගැනීමෙන් **පසු** අදාල ක්ෂේත්‍රය පිළිබඳව අවුරුදු 04 ක පළපුරුද්ද.

<u>**සටහන**</u> තාක්ෂණ විද්‍යා ජාතික ඩිප්ලෝමා පාඨමාලාවට අදාල අවුරුදු 4ක පුහුණු කාලසීමාව ඉහත පළපුරුද්දට අදාල නොවේ.

හෝ

(II) ජාතික තාක්ෂණ සහතිකය හෝ ඊට සමාන සුදුසුකම් සහ එම සුදුසුකම් ලබා ගැනීමෙන් පසු අදාල ක්ෂේත්‍රය පිළිබඳව වසර 10 ක පළපුරුද්ද.

වැටුප් ක්‍රමය : රු.28,185-6x335;13x435-35,889/- (මාසික) U-MT1(I)

03 **<u>කාර්මික නිලධාරි - II ශ්‍රේණිය "අ" ඛණ්ඩය</u>**

| | | |
|---|---|---|
| අවශ්‍ය සුදුසුකම් : | (අ) | අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සම්මාන සාමාර්ථ 05ක් සහිතව විෂයයන් 06කින් සමත් වී තිබීම. (සම්මාන සාමාර්ථ ලබාගත් විෂයන් අතරට විද්‍යාව හා ගණිතය යන විෂයන් ඇතුළත් විය යුතුය.) |
| | | හෝ |
| | (ආ) | තෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විද්‍යාව සහ ගණිතය විෂයයන් ඇතුළුව විෂයයන් 06කින් සමත්ව තිබීම සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක වර්ෂ 08ක සතුටුදායක ස්ථිර සේවා කාලයක් තිබීම. |
| | | හෝ |
| | (ඇ) | උසස් අධ්‍යාපන ආයතනයක විද්‍යාගාර සහායකයකු වශයෙන් වසර 15 ක ස්ථිර සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම. |
| | <u>සටහන</u> | බඳවා ගනු ලබන තැනැත්තන් ප්‍රථමයෙන් අවුරුදු 03 ක පුහුණුවීමේ කාලසීමාවකට යටත්ව රු.22,571/- ක ස්ථාවර මාසික වැටුපක් මත "පුහුණුවන කාර්මික නිලධාරි" වශයෙන් පත් කරනු ලැබේ. පුහුණුවීමේ කාලය අවසන් වීමෙන් පසු විද්‍යාගාර කටයුතු පිළිබඳ නිපුණත්වය, බඩු ඇණවුම් කිරීම, තොග පොත් පවත්වාගෙන යාම සහ ඉංග්‍රීසි භාෂාවෙන් යතුරු ලිවීම පිළිබඳ ප්‍රවීණත්වයක් ලබාගත් සේවක භවතුන් සේවයේ ස්ථිර කර "11 ශ්‍රේණියේ "අ" ඛණ්ඩයේ" කාර්මික නිලධාරි තනතුරට පත් කරනු ලැබේ. |
| වැටුප් ක්‍රමය : | | රු.22,571-7x213;10x253-26,592/-(මාසික) U-MT1(III A) |

04 **<u>සැලසුම්කරු (පහළ ශ්‍රේණිය)</u>**

| | | |
|---|---|---|
| අවශ්‍ය සුදුසුකම් | (I) | පිළිගත් රජයේ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් ආයතනයක සැළසුම් ශිල්පය පිළිබඳ විභාගය සමත්ව තිබීම. |
| වැටුප් ක්‍රමය : | | රු.22,571-7x213;10x253-26,592/-(මාසික) U-MT 1(III A) |

05 **<u>පරිපාලක (සිවිල්) III ශ්‍රේණිය</u>**

| | | |
|---|---|---|
| අවශ්‍ය සුදුසුකම් | I (අ) | ජාතික තාක්ෂණ සහතිකය හෝ සමාන සුදුසුකම් සමඟ අවුරුදු 03 ක පළපුරුද්දක් ලබා තිබීම. (තුන් අවුරුදු පළපුරුද්ද ජාතික තාක්ෂණ සහතික පාඨමාලාව හැදෑරීමේ කාලය තුලදී ලබා තිබීම ප්‍රමාණවත් වේ.) |
| | | හෝ |
| | (ආ) | දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් විෂයයන් 06 කින් සමත්ව තිබීම හා රජයේ දෙපාර්තමේන්තුවක, පළාත් පාලන ආයතනයක, සංස්ථාවක හෝ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ පරිපාලකවරයකු වශයෙන් අවුරුදු 05 ක පළපුරුද්දක් ලබා තිබීම. |
| වැටුප් ක්‍රමය : | | රු.22,571-7x213;10x253-26,592-(මාසික) U-MT 1(III A) |

06 **පරිපාලක (භූමි දර්ශක) III ශ්‍රේණිය**

| | | | |
|---|---|---|---|
| අවශ්‍ය සුදුසුකම් | (I) | අ | අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 කින් සමත්ව තිබිය යුතුය. |
| | | | සහ |
| | | ආ | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන වසරක කාලයක ප්‍රායෝගික කෘෂිකර්ම පාඨමාලාවක් සාර්ථකව නිමකර තිබීම හෝ ඊට සමාන සුදුසුකමක් සපුරා තිබීම. |
| | | | හෝ |
| | (II) | | තෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයෙන් සමත් වී ඇති උසස් අධ්‍යාපන ආයතනයක හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි සේවයේ නියුතු හා උද්‍යාන අලංකරණ කටයුතු පිළිබඳ උසස් අධ්‍යාපන ආයතනයක හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි/හෝ උද්භිත උද්‍යානයක වසර 10 ක පළපුරුද්දක් ලබා තිබීම. |

වැටුප් ක්‍රමය : රු.22,571-7x213;10x253-26,592/- (මාසික) U-MT1(III A)

07 **හෙදි නිලධාරිනී (දන්ත)**

| | | | |
|---|---|---|---|
| අවශ්‍ය සුදුසුකම් | (I) | අ | අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සම්මාන 05 ක් සහිතව විෂයයන් 06 කින් සමත්වී තිබීම.සම්මාන සාමාර්ථ ලබාගත් විෂයන් අතරට විද්‍යාව සහ ගණිතය ද ඇතුලත්ව තිබීම. |
| | | | හෝ |
| | | ආ | තෙවරකට නොවැඩි වාර ගණනකදී විද්‍යාව හා ගණිතය ඇතුලත්ව විෂයයන් 06 කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීම සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක වසර 08 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය. |
| **සටහන-** | සේවා කොන්දේසි | | බඳවාගනු ලබන ලබන්නන් ප්‍රථමයෙන් අවුරුදු 03 ක පුහුණු කාලයකට යටත්ව ඉහත වැටුප් පරිමාණයේ රු.22,571/-ක ස්ථාවර මාසික වැටුපක් මත පුහුණුවන දන්ත හෙදි නිලධාරිණියක ලෙස පත් කරනු ලැබේ. පුහුණුවීමේ කාලසීමාව අවසානයේදී තනතුරේ රාජකාරි වලට අදළ ප්‍රවීණතාවයක් සහ ඉංග්‍රීසියෙන් යතුරු ලියනය කිරීමේ නිපුණතාවයක් ලබාගත් අය සේවයේ ස්ථිර කොට හෙදි නිලධාරිණී (දන්ත) 11 ශ්‍රේණිය තනතුරට පත් කරනු ලැබේ. |

වැටුප් ක්‍රමය : රු.22,571-7x213;10x253-26,592/- (මාසික) U-MT 1(III A)

08 **පුස්තකාල තොරතුරු සහකාර III ශ්‍රේණිය**

අවශ්‍ය සුදුසුකම්: (අ) දෙවතාවකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 05 කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) අ.පො.ස.(සා.පෙළ) විභාගය සමත් විය යුතුය. සම්මාන ලත් විෂයයන්ගෙන් 02 ක් සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව හෝ සාහිත්‍යය විය යුතුය.

හෝ

(ආ) තුන් වතාවකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව උසස් අධ්‍යාපන ආයතනයක පුස්තකාලයක වසර 05 ක ස්ථිර සේවා කාලයක් සතුටුදයක ලෙස සම්පූර්ණ කර තිබිය යුතුය. අ.පො.ස.(සා.පෙළ) විභාගයේදී සමත්ව ඇති විෂයයන්ගෙන් විෂයයන් 02 ක් සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව හෝ සාහිත්‍යය විය යුතුය.

**සටහන** පුස්තකාල කටයුතු සම්බන්ධව සුදුසුකම් සහ/හෝ පළපුරුද්දක් ලබා ඇති අය කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

වැටුප් ක්‍රමය : රු.21,932-17x213-25,553/-(මාසික) U-MN 1(IIIA)

09 **යාන්ත්‍රික II ශ්‍රේණිය**

අවශ්‍ය සුදුසුකම්: (I) කියවීමට හා ලිවීමට හැකියාව තිබීම.

(II) පහත දැක්වෙන කරුණු පිළිබඳව හැකියාව තිබිය යුතුය.

(අ) පරිමාණයන් කියවීම, මයික්‍රොමීටර් සහ සූක්ෂම මාන සටහන් කියවීම.

(ආ) වාෂ්ප එන්ජින් යන්ත්‍ර සහ ඩීසල් පිරියත හා යන්ත්‍රෝපකරණ වල විශේෂිත සවි කිරීම් වර්ග හෝ කර්මාන්තශාලා ලියවන පට්ටල්, මිල්ලම් කිරීමේ යන්ත්‍ර සහ හැඩගාන යන්ත්‍ර ක්‍රියා කරවීමේ හැකියාව.

(ඇ) රූ සටහන් කියවීම හා තේරුම් ගැනීමේ හැකියාව.

(III) යාන්ත්‍රිකයෙකු හෝ යන්ත්‍ර ක්‍රියකරවන්නෙකු වශයෙන් අවුරුදු 02 කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.

වැටුප් ක්‍රමය : රු.21,356-16x192-24,428/-(මාසික) U-PL 3(III)

**10 වාත්තුකරු 11 ශ්‍රේණිය**

| | | |
|---|---|---|
| අවශ්‍ය සුදුසුකම් | (I) | කියවීමට හා ලිවීමට හැකියාව. |
| | (II) | අඟලෙන් 1/64 දක්වා පරිමානයන් කියවීමේ හැකියාව, වාත්තුමල් සංකෝචන කෝදුව පාවිච්චි කිරීම, වාත්තු වැඩ සාමාන්‍යයෙන් මල බැඳෙන සහ මල නොබැඳෙන වාස්තු සඳහා වැලි මිශ්‍රණ කෝව පාවිච්චිය, වැලි ගම් වර්ග සහ වාස්තු මට්ටම් කිරීම, ලූම් ක්‍රමයට නල කෝව ලියවීම සහ ටෙම්පෙල්ඩ් භාවිතයෙන් කෝව සෑදීම, සැකිලි ක්‍රමයට කෝව පෙට්ටි සෑදීම, තෙල් සහ වැලි මිශ්‍රණ, එය පිළියෙල කර ගැනීම සහ වාත්තුවක් සඳහා කෝව සාදා ගැනීම ආදිය පිළිබඳ දැනුම තිබිය යුතුය. |
| | (III) | රජයේ දෙපාර්තමේන්තුවක,රාජ්‍ය සංස්ථාවක හෝ ඉංජිනේරු ආයතනයක කෝව සාදන්නකු වශයෙන් අවුරුදු 02 කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය. |
| | **සටහන** | විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ කම්කරුවකු පුහුණු තනතුරක රාජකාරි ඉටු කිරීමට සහාය වීමෙන් ලබාගෙන ඇති පළපුරුද්ද, ඉහත සඳහන් කර ඇති පළපුරුද්දට සමාන ලෙස පිළිගනු ලැබේ. |
| වැටුප් ක්‍රමය: | | රු.21,356-16x192-24,428/-(මාසික) U-PL 3(III) |

වැඩ බලන ලේඛකාධිකාරී
මොරටුව විශ්වවිද්‍යාලය,
මොරටුව.
2017.07.20